පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 06

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය 2 යි

## 1 කොටස

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. සිංහල අක්ෂර මාලාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ
   I.මහප්‍රාණ හා තාලුජ II.ස්වර හා ව්‍යඤ්ජන III.තාලුජ හා මූර්ධජ IV.ස්වර හා දන්තජ
2. ගයනුකිත්ත හා කෙටි පාපිල්ල පමණක් යෙදුණු වචන පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න
   I.සෞන්දර්ය - නින්ද II.බෝලය - නුවන් III.ගෞරවය - කුඹියා IV.ඖෂධ - රුවට
3. මහප්‍රාණ අක්ෂර සහිත වචන පමණක් ඇති පිළිතුර තෝරන්න
   I. ස්ථාවර,පුෂ්පය,වර්ගඵලය II. අවබෝධය,සංඛ්‍යාව,පීඨය
   III. පහණ,භයානක,සංසයා IV. ඡන්දය,දහවල්,ස්ථාන
4. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පමණක් අඩංගු පිළිතුර තෝරන්න
   I. විදර්ශනා,විදේසික,ඓතිහාසික II. පාෂාණ,දෙරණ,මිණිරණ
   III. පෝෂණය,සැපින්න,කුමන්ත්‍රණය IV. සම්ප්‍රදාය,මර්ධනය,ප්‍රතිඵල
5. අනුක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න
   I. අපි / කුරුල්ලෝ / කවීන් II. ගුරුවරු / ළමයි / කුමාරයෙක්
   III. දරුවෝ / වෛද්‍යවරු / නළුවන් IV. බමුණන් / රෝගීන් / මව්වරුන්
6. ප්‍රථම පුරුෂ ඒක වචන පුරුෂ ලිංග අතීත කාල ක්‍රියා පදය තෝරන්න
   I. කරති II. කළාය III. කළේය IV.කරයි

❖ විරුද්ධාර්ථ පද නිවැරදිව යෙදී නොමැති පිළිතුර තෝරන්න

7. I. දේශිය - විදේශීය II. නිශ්චල -චංචල III. ආහාර - භෝජන IV. නූතන - පුරාතන
8. I. ආගන්තුක ී- නේවාසික II. ආලෝකය - එළිය III. නව - පැරණි IV. විශේෂ - සාමාන්‍ය

❖ සමානාර්ථ පද නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න

9. I. මුහුණ - කට II. මිත්‍රයා - සතුරා III. අඳුර - ආලෝකය IV.ප්‍රසිද්ධ -ප්‍රකට
10. I. පක්ෂියා - විහඟ II. දිනකර - චන්ද්‍රයා III. කාන්තාව -වත IV.අහස - මිහිකත

11. යුගල පදයක් නොමැති පිළිතුර තෝරන්න

I. සතුරු මිතුරු II. හට්ටි මුට්ටි III.අහස උසට IV. තාන්න මාන්න

12. ''කියවීම් සඳහා හොඳ පොතක් තෝරා ගන්න''යයි ගුරුතුමා පැවසුවේය. මෙම වාක්‍ය තුළ ඇති නාම විශේෂණ පදය තෝරන්න.

I. කියවීම් I. පොතක් III. ගුරුතුමා IV. හොඳ

❖ ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න

13. I. නිවේදකයෝ වැඩසටහන මෙහෙයවති. II. අපි හොඳින් පාඩම් කරති.

III.ගුරුතුමා ගණිතය පාඩම නිවැරදි කෙරුවෝය. IV. වෛද්‍යවරු රෝගීන් සුවපත් කරයි.

14. I. ලේඛකයෝ පාඨකයන් දැනුවත් කරයි. II. මම විදෙස්ගත වූයෙමි.

III.ගස් සුළඟට සෙලවෙති. IV.මා උදෑසනින්ම සුභ පතමි.

❖ ගැළපෙන තනිපදය තෝරන්න

15. ජනයාගෙන් පිරුණු

I. ජන ශුන්‍ය II. ජනාකීර්ණ III. නාගරික IV. පෞරාණික

16.ජලයෙහි හැසිරෙන

I. වනචර II. ජලජ III. නිශාචර IV. ජලචර

17. සදවා සුදු වැලි පිවිතුරු -බඳවා රන් දද පියකරු

සිටුවා දොර දොර රඹතුරු - තබවා පුන්කුඹු විසිතුරු යන පද්‍ය උපුටා ගත් ග්‍රන්ථය වන්නේ

I. ගුත්තිල කාව්‍ය II. කාව්‍ය ශේඛරය III. සැළලිහිණි සන්දේශය IV. සිරිත් මල්දම

18. නො ගැළපෙන පිළිතුර තෝරන්න

I. උදය සිරි - එස් මහින්ද හිමි II.ගුත්තිල කාව්‍යය - වැත්තැවේ හිමි

III. කාව්‍යශේඛරය - වීදාගම මෛත්‍රී හිමි IV. පුංචි පැළේ ගස වෙනා - කේ ජයතිලක

19. පන්සිය පනස් ජාතක පොත රචනා වූ සාහිත්‍ය යුගය වන්නේ

I. දඹදෙණිය යුගය II.ගම්පොළ යුගය III. කුරුණෑගල යුගය IV. පොළොන්නරු යුගය

20. අපේ ගම නව කතාව රචනා කළ කතුවරයා වන්නේ,

I. කුමාරතුංග මුනිදාස මහතා II. මාර්ටින් වික්‍රමසිංහ මහතා

III. ටී බී ඉලංගරත්න මහතා IV. ජී බී සේනානායක මහතා

(ලකුණු 2X20 = 40)

## 11 කොටස

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

01. පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් තෝරාගෙන වචන (150) කට නොඅඩු වන සේ රචනයක් ලියන්න

I. මා ගිය අධ්‍යාපන චාරිකාව.
II වන සම්පත ආරක්ෂා කරමු.
III. සමගිය බලය වේ.
IV. වැඩිහිටියන්ට සලකමු.

(ලකුණු 20)

02.පහත සඳහන් උද්ධෘත පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

I. නිති ගේ දොර ඇම ද
කැලි කසළ දැක නොම ඉද
..........................................................................................
..........................................................................................

I.ඉතිරි කවි පද දෙක සම්පූර්ණ කරන්න

II. මෙම කවිය උපුටා ගත් පාඩම කුමක් ද ?...........................................................

II. ''ඔබ වහන්සේට මම දාමරික නොවෙමි ''

I.මෙය කවුරුන් විසින් කාහට කියන ලද්දක් ද?.......................................................

II.මෙම උද්ධෘත පාඨය ඇතුළත් වූ පාඩම කුමක් ද?...................................................

III. ''ගොහින් බලාපල්ලා මගේ වී ගොඩ ''

I. මෙය කියන ලද්දේ කවුරුන් විසින් කාහට ද?...................................................

II. මෙම උද්ධෘත පාඨය ඇතුළත් පාඩම කුමක් ද ?...................................................

IV. ''මම මහනුවර අසල ගම් වැසියෙක්මි ''

I. මෙය කවුරුන් විසින් කාහට පවසන ලද්දක් ද?...................................................

II. මෙම උද්ධෘත පාඨය ඇතුළත් පාඩම කුමක් ද ?...................................................

V. ''තෝ බැස පැන් බොතියි සිතන්නෙහි දැ '' යි

I. මෙය කවුරුන් විසින් කා හට පවසන ලද්දක් ද?...................................................

II. මෙම උද්ධෘත පාඨය උපුටා ගත් පාඩමේ නම කුමක් ද ?...................................................

(ලකුණු 3X5 = 15)

03.පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

ඔහු අපට සාහිත්‍ය ඉගැන්වීම් ආරම්භ කරන ලද්දේ අටවෙනි ප්‍රමාණයේ දී ය. අවුරුදු තුන හතරක් ගත වන කලියෙන් කව්සිළුමිණ දක්වා සැම පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් ම මා කියවා තිබුණේ යැයි කීම අතිශයෝක්තියක් නොවේ. මේ කාලයේ දී මාගේ ස්මරණ ශක්තිය ද අධික විය. ගුත්තිලයෙහි අගය කිසිවෙකු අපට පෙන්වා දී නො තිබුණු නමුත් එයින් භාගයක් පමණ මට කට පාඩමෙන් කිව හැකි විය. උම්මග්ග ජාතකයේ මුල් පිටු ගණනක් ම මතක තිබිණි. ඩබ්ලිව්. ඒ. සිල්වාගේ නවකතාවල සමහර කොටසුත්, ඊ.තෙන්නකෝන්ගේ වවුලුව පද්‍ය පන්තියෙන් විශාල කොටසකුත් එක දිගට ම මතකින් කිව හැකි විය. එපමණක් නොව කුමාරතුංග විවරණ ග්‍රන්ථ මා කියවූයේ නවකතාවක් කියවන තරමේ අභිරුචියකිනි. කුමාරතුංගට සිය බහුශ්‍රැතතාව ඉක්මවා යන නිර්මාණ ශක්තියක් තිබිණි. වචනයක් දෙකක් වෙනස් කොට අනුන්ගේ නීරස කවියකට පවා රස බහා ලීමේ ශක්තියක් ඔහුට තිබිණ.

I. ඡේදයේ සඳහන් වන සිංහල සාහිත්‍ය ග්‍රන්ථ තුනක් නම් කරන්න. ..............................................

II. වවුලුව පද්‍ය පන්තිය කාගේ නිර්මාණයක් ද ?-..................................................................

III. අනුන්ගේ නීරස කවියකට පවා රස බහා ලීමේ ශක්තියක් තිබුණේ කාට ද ?..............................................

IV. පහත වචනවලට විරුද්ධ පද ඡේදයෙන් තෝරා ලියන්න

(අ) තිබුණු -..................................................................

(ආ) රස - ..................................................................

V. ඡේදයේ සඳහන් පහත වචනවල අරුත් පැහැදිලි කරන්න

(අ) ස්මරණය --..................................................................

(ආ) අභිරුචිය - -..................................................................  (ලකුණු 2X5 = 10)

04. පහත සඳහන් අවස්ථා දෙකින් එකකට පමණක් පිළිතුරු සපයන්න

(අ) පාසලේ පැවැත්වුණු තෑගි දීමේ උත්සවය පිළිබඳ විස්තර දන්වා වෙනත් පාසලකට අස් වී ගිය මිතුරෙකුට / මිතුරියකට ලිපියක් ලියන්න

(ආ 12 වන උපන්දිනය සමරන ඔබගේ යහළුවාගේ / යෙහෙළියගේ උපන් දින සැමරුම සඳහා සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න

(ලකුණු 15)